**09-10-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් කටු වලින් මල් බවට පත් වෙනවා. ඔබ සෑම විටෙකම අන් අයට සතුට ලබා දිය යුතුයි. ඔබ කිසිම කෙනෙක්ව දුකට පත් නොකළ යුතුයි.

**ප්‍රශ්නය:** උත්සාහ දරන දරුවන්, ඔවුන්ගේ හදවතින් පවසන්නේ කුමන අංක එකේ වදන්ද?

**පිළිතුර:** 'බාබා, කරදර නොවන්න, මා අනිවාර්යයෙන්ම සම්මාන ඇතුව සමත් වී, සෑම කෙනෙකුටම පෙන්වන්නම්.' ඔවුන්ගේ වාර්තා පොත්ද ඉතා හොඳ වනු ඇත. ඔවුන් කිසිම විටෙක මෙවන් වදන් පවසන්නේ නැත : “මා තවමත් උත්සාහ දරන්නෙක්.” ඔබ උත්සාහ දරා කෙබඳු මහාවීරයෙක් විය යුතුද යත්, මායාට සුළවෙන්වත් ඔබව චංචල කිරීමට නොහැකි වනු ඇත.

ඕම් ශාන්ති. ඔය සුමිහිරි ආධ්‍යාත්මික දරුවන්, ආධ්‍යාත්මික පියා සමඟ ඉගෙනුම් ලබනවා. ඔබ තමන් ජීවාත්ම බව සැළකිය යුතුයි. අශාරීරික ජීවාත්ම වන අප දරුවන්, අශාරීරික පියා සමඟ ඉගෙනගන්නවා. ලෝකයේ ඔබට උගන්වන්නේ ශාරීරික ගුරුවරුන් පමණයි. මෙහි, උගන්වන්නේ අශාරීරික පියා, අශාරීරික ගුරුවරයාය. මෙම කෙනාට වටිනාකමක් නැත. ශිව බාබා, අසීමිත පියා පැමිණ, මෙම කෙනාට වටිනාකමක් ලබා දෙනවා. වඩාත්ම වටිනා කෙනා වන්නේ, පැමිණ දෙව්ලොව ස්ථාපිත කරන, ශිව බාබාය. ඔහු එතරම් ශ්‍රේෂ්ඨ කාර්යයක් සිදුකරන්නේ! පරම පියා, උසස්ම- උසස් කෙනා ලෙස සිහිපත් කර ඇති බැවින්, ඔය දරුවන්ද, උසස්ම අය විය යුතුයි. පරම පියා, උසස්ම උසස් කෙනා බව ඔබ දන්නවා. දෙව්ලොව රාජධානිය දැන් සැබවින්ම ස්ථාපිත කරන බව, ඔබගේ බුද්ධියේ තිබේ. මෙය සංගම යුගයයි, ස්වර්ණමය යුගය සහ කලි යුගය අතර සංගමයයි, ඔබ වඩාත්ම ශ්‍රේෂ්ඨත්වයට පත්වන සංගම යුගයයි. මිනිසුන්ට 'පුරුෂෝත්තම්' (වඩාත්ම උත්තම ජීවය) යන වචනයේ අරුත වැටහෙන්නේ නැත. උසස්ම-උසස් කෙනා, ඉන්පසුව පහත්ම පහත් කෙනා බවට පත් වනවා. පිවිතුරු සහ අපවිත්‍ර අතර විශාල වෙනසක් තිබේ. දේවතාවන්ට වඳින අය පවසන්නේ ඔබ සියලුම ගුණධර්ම වලින් පිරී ඇත. ලෝක පාලකයන් ඔබයි. ඉන්පසුව ඔවුන් තමන් ගැන පවසන්නේ විෂ ගංඟාවේ ගිලෙමින් සිටින අය, අපි. ඔවුන් මෙය නිකම් කියනවාට කියයි ඔවුන් එය සැබවින්ම විශ්වාස කරන්නේ නැත. නාටකය අසහාය මෙන්ම ඉතාමත්ම අලංකාරයි. ඔබ සෑම චක්‍රයකම එවන් දේට සවන් දෙනවා. පරම පියා පැමිණ ඔබට විස්තර කරනවා. පරම පියාට සම්පූර්ණයෙන්ම ආදරය කරන අයට එම විශාල ආකර්ෂණය දැනෙයි. ජීවාත්ම, පරම පියාව මුණගැසෙන්නේ කෙසේද? හමුව සිදුවන්නේ ශාරීරික ලෝකයේය අශාරීරික ලෝකයේදී, ආකර්ෂණයක් අත්විඳීම ගැන ප්‍රශ්නයක් නැත. එහි සියලුම ජීවාත්ම පිවිතුරුයි සියලුම මලකඩ ඉවත් වී තිබේ. එහි ආකර්ෂණයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. සෙනෙහස පිළිබඳ ප්‍රශ්නය මතු වන්නේ මෙහිදීය. ඔබ එවන් බාබා කෙනෙක්ව ඉතාමත්ම තදින් මුළුමනින්ම අල්ලා ගත යුතුයි. 'බාබා, ඔබ කෙතරම් ආශ්චර්යමත් දේ සිදුකරනවාද! ඔබ අපගේ ජීවිත බොහෝ සේ අලංකාර කරනවා!' බොහෝ සෙනෙහස අවශ්‍යයි. එම සෙනෙහස නොමැත්තේ ඇයි? ජීවාත්මය, මලකඩ වලින් වැසී ඇති නිසා. ඔබ සිහිපත් කිරීමේ වන්දනාවේ නොසිටින්නේ නම්, ඔබගේ මලකඩ ඉවත් කළ නොහැකි වන අතර ඔබට එතරම් ආදරණීය විය නොහැක. ඔය මල් පිබිදිය යුත්තේ මෙහිය. ඔබ උපතින් උපතට එහි මල් වීමට පෙර, ඔබ මෙහිදී මල් බවට පත් විය යුතුයි. ඔබ කටු වලින් මල් බවට පරිවර්තනය වීම ගැන බොහෝ ප්‍රීතියට පත් විය යුතුයි! මල් සෑම විටෙකම සෑම කෙනෙකුටම සතුට ලබා දෙයි. සෑම කෙනෙක්ම මල්, ඔවුන්ගේ දෑසට ඔසවා, එහි සුවඳ විඳගනී. ඔවුන් මල් වලින් සුවඳ වතුර සාදයි. ඔවුන් රෝස වතුරද සාදයි. ඔබව කටු වලින් මල් බවට පත් කරවමින් සිටියි. ඔබව මල් බවට පත් කරවන්නේ පරම පියාය. ඔය දරුවන්ට සතුටක් නොමැත්තේ ඇයි කියා බාබාට ප්‍රශ්නයකි. ඔහු ඔබව ස්වර්ණමය යුගයේ මල් බවට පත් කරවනවා. මල් පරණ වන විට ඒවා සම්පූර්ණයෙන්ම මැලවෙයි. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්තනය වන බව, ඔබගේ බුද්ධිය දන්නවා. තමෝප්‍රධාන් මනුෂ්‍යයින් සහ සතෝප්‍රධාන් දේවතාවන් අතර විශාල වෙනසක් තිබේ! පරම පියා හැර වෙනත් කිසිවෙකුට මෙය විස්තර කළ නොහැක. ඔබ ඉගෙනගන්නේ දේවතාවන් වීමට බව ඔබ දන්නවා. ඉගෙනුමෙහි කුල්මත්භාවය තිබේ, එහෙම නේද? ඔබ දැන් බාබා සමඟ ඉගෙනගන්නා බවත් ඉන්පසුව ඔබ ලෝක පාලකයන් වන බවත් ඔබට වැටහෙනවා. ඔබගේ ඉගෙනුම අනාගතය වෙනුවෙනි. ඔබ අනාගතය වෙනුවෙන් කරන ඉගෙනුමක් ගැන කිසිදා අසා තිබේද? ඔබම කියන්නේ, ඔබ නව ලෝකයට, නව උපත වෙනුවෙන් ඉගෙනගන්නා බවයි. පරම පියා ඔබට කර්ම, අකර්ම සහ පාපකර්ම වල හේතුඵල වාදය විස්තර කරයි. මෙයද ගීතාවේ සඳහන් කර ඇති නමුත්, ගීතාව හදාරන අයට, එහි අරුත වැටහෙන්නේ නැත. ස්වර්ණමය යුගයේදී

ක්‍රියා අකර්ම බවත් රාවනගේ රාජධානිය ආරම්භ වූ විට, ක්‍රියා පාපකර්ම වන බවත්, ඔබට පරම පියාගෙන් දැන ගැනීමට ලැබී තිබේ. උපත් 63 කට ඔබ එවන් පාපකර්ම සිදුකරමින් සිටියා! ඔබගේ හිස් මත විශාල පාප බරක් තිබේ. සැම කෙනෙක්ම පාප ජීවාත්මයක් බවට පත් වී තිබේ. අතීත පාපයන් ඉවත් කළ හැක්කේ කෙසේද? ඔබ ආරම්භයේදී සතෝප්‍රධාන්ව සිටි බවත් ඉන්පසුව ඔබ උපත් 84 ක් ගත් බවත් ඔබ දන්නවා. පරම පියා ඔබට නාටකය පිළිබඳ හැඳින්වීම ලබා දී තිබේ. පළමුවන රාජධානියේ ආරම්භයේදී පැමිණෙන අය, උපත් 84 ක් ගන්නා අතර, ඉන්පසුව පරම පියා පැමිණ, ඔබට ඔබගේ රාජධානියේ භාග්‍යය ලබා දෙයි. ඔබ දැන් ඔබගේ රාජධානිය හිමි කරගනිමින් සිටිනවා. ඔබ උපත් 84 හි චක්‍රය වටා ගොස් ඇති අන්දම ගැන ඔබට දැන් වැටහෙනවා. ඔබ දැන් නැවතත් පිවිතුරු විය යුතුයි. බාබා සිහිපත් කිරීමෙන්, ජීවාත්ම පිවිතුරු වන අතර, එවිට ඔවුන්ගේ පැරණි සිරුරු විනාශ වී යයි. ඔය දරුවන්ට අනන්ත සතුට තිබිය යුතුයි. පරම පියා, පියා වීම, පරම පියා, ගුරුවරයා සහ සත්ගුරු වීම, මෙන්ම තිදෙනාම උසස්ම-උසස් වීම ගැන ප්‍රශංසාව, ඔබ මින් පෙර කිසිදාක අසා නැත. තිදෙනාම එක්කෙනෙකි සත්‍ය පියා, සත්‍ය ගුරුවරයා සහ සත්‍යගුරු. ඥාන මහා සාගරය වන බාබා, සියලුම ජීවාත්මයන්ගේ පියා, අපට දැන් උගන්වනවා කියා ඔබට හැඟී යයි. ඔහු ක්‍රමවේදය නිර්මාණය කරයි. සඟරා වල බොහෝ හොඳ කරුණු දිගින් දිගටම මතු වෙනවා. පාට සඟරාවක් තිබීමේ හැකියාවක් ඇත. නමුත් එහි අකුරු ඉතා කුඩාය. සියලුම පිංතූර දැනටමත් නිර්මාණය වී ඇත. ඔබ සැම පිංතූරයකම සිටින සැම කෙනෙකුගේම කාර්යභාරය දන්නවා. ඔබ ශිව බාබාගේ කාර්යභාරයත් දන්නවා. දරුවන්ට අනිවාර්යෙන්ම ඔවුන්ගේ පියාගේ කාර්යභාරය, පියා විසින් කියනු ලබයි. ඔබ පෙරකල කිසි දෙයක් දැන සිටියේ නැත. ඉගෙනගැනීම ගැන කුඩා දරුවන් දන්නේ මොනවාද? ඔවුන් ඉගෙනගැනීම ආරම්භ කරන්නේ වයස 5 දීය. ඉන්පසුව උසස් විභාගයක් සමත් වීමට, ඔවුන්ට වසර ගණනාවක් ඉගෙනගැනීමට සිදුවෙයි. ඔබ බොහෝ සාමාන්‍යයි, එහෙත් බලන්න ඔබ කවුරුන් බවට පත් වනවාද කියා! ලෝකයේ අධිපතියන් බවට! ඔබව බොහෝ සෙයින් සරසයි! එම ස්ථානයේ වර්ණනාව වන්නේ 'රත්තරං හැන්දක් කටේ.' දැන් පවා, සමහර හොඳ දරුවන් තම ශරීර අත්හළ විට, ඔවුන් ඉතා හොඳ නිවෙස්වල උපත ලබයි. එබැවින් ඔවුන්ට කටට රත්තරං හැන්දක් ලැබෙයි. ඔවුන් අනිවාර්යෙන්ම පෙර ගමන් මගේ කෙනෙක් වෙතට යයි. පළමුවන පාපයෙන් තොර උපත ලබන්නේ ශ්‍රී ක්‍රිෂ්ණා පමණයි. මෙහි හැර යන අන් සියලුම දෙනා උපතක් ලබන්නේ දූෂිත අයටයි. කෙසේවෙතත්, ඔවුන් මව් කුස තුළ බොහෝ දඬුවම් අත් නොවිඳිනු ඇත. ඔවුන් ඉතාම හොඳ නිවෙස් වල උපතක් ලබයි. ඔවුන්ගේ පාපයන් කැපී ගොස් තිබෙනු ඇති අතර ඉතා සුළු ප්‍රමාණයක් පමණක් ඉතිරිව තිබෙයි. ඔවුන් එතරම් දුක් විඳින්නේ නැත. ඔබ තව දියුණුවත්ම, මහා රාජකීය පවුල්වල රජකුමර කුමරියන් ඔබ වෙතට පැමිණෙන ආකාරය ඔබ දකියි. පරම පියා ඔබව බොහෝ සේ ප්‍රශංසා කරයි! මා ඔබව මටත් වඩා උසස් බවට පත් කරවන්නෙමි, භෞතික පියෙක් ඔහුගේ දරුවන්ව සතුටට පත් කරන ආකාරයෙන්. ඔහු 60 වෙනි වියට පත් වූ සැනින්, විශ්‍රාමික අවදියට ගොස් භක්තියේ තමන්ව කාර්ය බහුල කරගනී. කිසි කෙනෙකුට ඔවුන්ට ඥානය ලබා දිය නොහැක. සියලු දෙනාට ඥානය තුළින් විමුක්තිය පිරිනමන්නේ මමයි. සැම කෙනෙකුටම ඔබ නිසා යහපතක් සිදුවෙයි, මන්ද ඔබට අනිවාර්යෙන්ම නව ලෝකය අවශ්‍ය නිසා. ඔබ බොහෝ සතුටට පත් වෙයි. ඔය දරුවන්ට නිර්මාංශ ආහාර ගන්නන්ගේ සම්මන්ත්‍රණයට ආරාධනාවක් ලැබී තිබේ. බාබා ඔබට එඩිතර වන්නට කියා අඛණ්ඩව පවසයි. දිල්ලිය වැනි නගරයක සැම තැනකම ඔබගේ හඬ පැතිරී යා යුතුයි. අන්ධ විශ්වාසය තුළින් ලෝකයේ බොහෝ භක්තිය තිබේ. ස්වර්ණමය සහ රිදී යුගවලදී, භක්තිය පිළිබඳ ප්‍රශ්නයක් නැත. එම දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම වෙනස්ය. ඥානයේ ප්‍රතිලාභය චක්‍රයෙන් භාගයක් පවතී. ඔබට අසීමිත පියාගෙන් උපත් 21 කට උරුමයක් හිමි වෙයි. ඔබ පරම්පරා 21 ක් සතුටින් සිටියි. එහි, මහළු වියේ වුවද, දුක පිළිබඳ සඳහනක් නොමැත. ඔබගේ සම්පූර්ණ ආයු කාලය පුරාවටම ඔබ සතුටින් සිටියි. ඔබගේ උරුමය හිමි කරගැනීමට ඔබ දරණ උත්සාහයේ ප්‍රමාණයට අනුකූලව, ඔබට හිමි වන තත්ත්වය උසස් වනු ඇත. එබැවින් ඔබ සම්පූර්ණයෙන් උත්සාහ දැරිය යුතුයි. මාලාව අංක පිළිවෙලට නිර්මාණය වන අන්දම ඔබට දැක ගත හැක. ඔබ එක් එක් කෙනා දරණ උත්සාහයට අනුවයි එය නිර්මාණය වන්නේ. ඔබලා ආශ්චර්යමත් ශිෂ්‍යයින්. පාසැල් දරුවන්ට ඉලක්කයක් වෙතට, තරඟයේ දිව යාමට පොළඹවනු ලබයි. බාබා පවසන්නේ ඔබත් ඉලක්කය වෙතට දිව ගොස් නැවත මෙහි පැමිණිය යුතුයි. සිහිපත් කිරීමේ වන්දනාවේ දිව ගොස්, අංක එක හිමි කරගන්න. ප්‍රධානතම දේ වන්නේ සිහිපත් කිරීමේ වන්දනාවයි. ඇතැම් දරුවන් කියන්නේ බාබා, මට අමතක වෙනවා. අහා! ඔබව ලෝකයේ අධිපතියෙක් බවට පත් කරවන පරම පියාව ඔබට අමතක වනවා! කුණාටු පැමිණෙන නමුත්, පරම පියා ඔබට එඩිතරකම ලබා දෙයි. ඒ සමඟම ඔහු මෙසේද පවසයි මෙය සටන් බිමක්. ඇත්ත වශයෙන්ම පරම පියාට යුධිෂ්ඨිර් (ඔබට සටන් කිරීමට උගන්වන කෙනා) කියා කිව යුතුයි, මන්ද ඔහු ඔබට සටන් කිරීමට උගන්වන බැවින්. යුධිෂ්ඨිර් වන පරම

පියා, ඔබට මායා සමඟ සටන් කිරීමට කියා දෙයි. මෙකල, මෙය සටන් භූමියකි. පරම පියා පවසන්නේ විශාලතම සතුරා වන්නේ රාගයයි. එය ජය ගැනීමෙන් ඔබ ලෝකය ජයගනී. ඔබගේ මුවින් ඔබට කිසි දෙයක් මැතිරීමට අවශ්‍ය නැත. ඔබ නිහඬව සිටිය යුතුයි. භක්ති මාර්ගයේ ඔවුන් බොහෝ උත්සාහ දරයි. ඔවුන් රාමා, රාමා කියා ඇතුලාන්තයෙන් මතුරයි. එයට දැඩි භක්තිය කියා කියයි. බාබා ඔබව ඔහුගේ මාලාවේ කොටසක් බවට පත් කරවන බව ඔබ දන්නවා. පසුව වන්දනාවට පාත්‍ර වන, රුද්‍රාගේ මාලාවේ පබුළු බවට ඔබ පත් වීමට යන බව ඔබ දන්නවා. රුද්‍රාගේ මාලාව සහ රුන්ඩාගේ මාලාව නිර්මාණය වෙමින් පවතිනවා. විෂ්ණුගේ මාලාවට, රුන්ඩාගේ මාලාව යැයිද කියයි. ඔබ විෂ්ණුගේ ගෙල වටා මල් මාලාව බවට පත් වනවා. ඔබ එසේ වන්නේ කෙසේද? ඔබ තරඟය දිනූ විට. ඔබ පරම පියාව සිහිපත් කළ යුතු අතර උපත් 84 හි චක්‍රය ගැන දැනුවත් විය යුතුයි. ඔබගේ පාපයන් දුරු වන්නේ පරම පියාව සිහිපත් කිරීමෙන් පමණයි. ඔබ ප්‍රදීපාගාරයක් වන්නේ කෙසේද? ඔබගේ එක් ඇසක, විමුක්ති දේශයත් අනෙක් ඇසේ, ජීවන-මුක්ති දේශයත් තිබේ. මෙම චක්‍රය ගැන දැනුවත් වීමෙන්, ඔබ ලෝකයේ පාලකයන්, සතුටු දේශයේ අධිපතියන් බවට පත් වෙයි. ඔය ජීවාත්ම පවසන්නේ ජීවාත්ම වන අපට, දැන් අපගේ නිවසට යෑමට තිබේ. අප එහි යන්නේ එය සිහිපත් කිරීමෙනි. සිහිපත් කිරීමේ වන්දනා ගමන මෙයයි. බලන්න, ඔබගේ වන්දනා ගමන කෙතරම් අංක එකේ එකක්ද කියා! ඔබ මෙතැන නිකම්ම අසුන්ගෙන සිටින අතර ඔබ කිරි සාගරයට යන බව බාබා දන්නවා. විෂ්ණුව පෙන්වා තිබෙන්නේ කෂීර සාගරයක සැතපී සිටින ආකාරයෙන්. පරම පියාව සිහි කිරීමෙන්, ඔබ කෂීර සාගරයට යයි. කිරි සාගරය දැන් නොපවතී. එම විල නිර්මාණය කළ අය, එය තුළට අනිවාර්යෙන්ම කිරි දමන්නට ඇති. පෙරකල කිරි බොහෝ ලාභ විය. ඔවුන් එක් පයිසාවකට කිරි කලයක්ම ලබා දෙයි. එබැවින් ඉන් මුළු විලක්ම නොතිබෙන්නේ ඇයි? දැන් කිරි ඇත්තේම නැහැ. සෑම තැනකම තිබෙන්නේ වතුර පමණයි. නේපාලයේ, විෂ්ණුගේ විශාල පිංතූරයක් බාබා දැක ඇත. ඔවුන් ඔහුව තද නිල් පැහැයෙන් නිමවා ඇත. සිහිපත් කිරීමේ වන්දනාවෙන් සහ ස්වදර්ශන චක්‍රය බ්‍රමණය කිරීමෙන්, ඔබ දැන් විෂ්ණුගේ දේශයේ අධිපතියන් බවට පත්වෙමින් සිටිනවා. ඔබ දිව්‍යමය ගුණධර්මද මෙහිදී ධාරණය කළ යුතුයි. මෙය වඩාත්ම සුබදායක සංගම යුගයයි. ඉගෙනගැනීමෙන් ඔබ වඩාත්ම උසස් වෙයි. ජීවාත්ම වල පහත් ස්වභාවය අවසන් වෙයි. ඔබට කුල්මත්භාවය දැනිය යුතු බව, බාබා ඔබට දිනපතාම විස්තර කරනවා. ඇතමුන් පවසන්නේ බාබා, මා උත්සාහ දරනවා. විවෘත හදවතකින් බාබාට කියන්න බාබා, මා ගැන කරදර වෙන්න එපා! මා අනිවාර්යෙන්ම සම්මාන සහිතව සමත් වනවා. ඉතා හොඳින් ඉගෙනගන්නා අංක එකේ දරුවන්ට හොඳ වාර්තාවක් තිබෙයි. ඔබ බාබාට පැවසිය යුතුයි බාබා, කරදර නොවන්න! මම අනිවාර්යෙන්ම ඔවුන් වගේ වෙනවා. බොහෝ ගුරුවරුන්, අංක එකේ අය බවත් බාබා දන්නවා. සෑම කෙනෙකුටම අංක එකේ කෙනෙක් විය නොහැක. හොඳ ගුරුවරුන් එකිනෙකාව හඳුනනවා. සෑම කෙනෙක්වම මහාරතීන්ගේ ගණයට ගෙන ඒමට නොහැක. වැදගත් මිනිසුන් පැමිණෙන ආකාරයෙන්, හොඳ විශාල මධ්‍යස්ථාන විවෘත කරන්න. පෙර චක්‍රයේද නිධන් ගබඩාව පුරවන ලදි. බාබා. සියලුම අධිරාජයන්ගේ අධිරාජයා, අනිවාර්යෙන්ම ඔබගේ නිධන් ගබඩාව පුරවයි. පියවරුන් දෙදෙනාටම බොහෝ දරුවන් සිටිනවා. ප්‍රජාපිතා බ්‍රහ්මාට දරුවන් කී දෙනෙක් සිටිනවාද? ඇතැම් අය දුප්පත්ද, තවත් සමහරු සාමාන්‍යද තවත් සමහරුන් ධනවත්ය. පෙර චක්‍රයේද මෙම කෙනාගේ මාර්ගයෙන්, රාජධානිය ස්ථාපිත විය. එයට රජවරුන්ගේ දිව්‍යමය භූමිය කියා කීහ (රාජස්ථාන්). එය දැන් රජවරුන්ගේ රකුසු භූමියයි. මුළු ලෝකයම දිව්‍යමය රජවරුන්ගේ භූමිය විය. එහි, බොහෝ විවිධ රටවල් පැවතුණේ නැත. දිල්ලිය තිබුණේ යමුණා ගංතෙර අසළයි. එයට ෆරිස්ථාන් (සුරඟනාවන්ගේ දේශය) යැයි කීහ. එහි ගංඟාවන් උතුරා ගියේ නැත. දැන් ඒවා බොහෝ සේ උතුරා යයි වේල්ලවල්ද කැඩෙයි. අපි ස්වභාව ධර්මයාගේ වහලුන් වී ඇති සේය. ඉන්පසුව ඔබ එහි අධිපතියන් වෙයි. ඔබට නිගරු කිරීමට කිසි බලයක් තිබෙන මායා එහි නොමැත. පෘථිවියට චංචල වීමට බලයක් නැත. ඔබ මහා වීරයන් (නිර්භීත සටන්කාමීන්) ද විය යුතුයි. හනුමාන්ට, මහාවීර යැයි කියයි. පරම පියා පවසන්නේ ඔබ සෑම කෙනෙක්ම මහාවීරයෙකි. මහාවීර දරුවන්ට කිසිම විටෙක චංචල විය නොහැක. මහාවීරයන්ට දේවාල තනා ඇත. එහි ඔවුන් බොහෝ ප්‍රතිමා නොතබයි. එබැවින් ආකෘතියක් සාදා ඇත. ඔබ දැන් භාරතය, දිව්‍ය ලෝකය බවට පත් කරවමින් සිටිනවා ඔබට එබැවින් බොහෝ සතුට තිබිය යුතුයි. ඔබ ඉතා හොඳින් ගුණධර්ම ධාරණය කළ යුතුයි. ඔබගේ දුර්වලතා දිගටම ඉවත් කරගන්න. සෑම විටෙකම ප්‍රබෝදමත්ව සිටින්න! කුණාටු පැමිණෙයි ඔබ මහාවීරයෙක් වීමේ බලය දිස්වන්නේ, ඔබ කුණාටු අත්විඳින විටයි. ඔබ ශක්තිමත් වන තරමට, වැඩියෙන් කුණාටු පැමිණෙයි. ඔබ දැන් උත්සාහ දරා, මහාවීරයන් බවට පත්වන්නේ ඔබ දරණ උත්සාහයට අනුව අංක පිළිවෙලටයි. ඥාන මහා සාගරය වන්නේ පරම පියා පමණයි. අන් සෑම දෙයක්ම, ශාස්ත්‍රීය පත පොත ආදීය, භක්තියේ දේවල්ය. ඔබට මෙම වඩාත්ම උසස් සංගම යුගය තිබේ. ක්‍රිෂ්ණා ජීවාත්මය මෙතැන අසුන්ගෙන

සිටිනවා. මෙම කෙනා, භගීරාත්ය (භාග්‍යවන්ත රථය). ඒ අන්දමින්ම ඔබ සෑම කෙනෙක්ම භාග්‍යවන්ත රථයි, මන්ද, ඔබ භාග්‍යවන්තයි. පරම පියාට, භක්ති මාර්ගයේදී, ඕනම කෙනෙකුගේ දර්ශනයක් පිරිනැමිය හැක. මේ නිසා ඔහු සර්ව ව්‍යාප්ත බව, මිනිසුන් පවසා ඇත. මෙයත් නාටකයේ දෛවයයි. ඔය දරුවන් බොහෝ උසස් ඉගෙනුමක් අධ්‍යයනය කරනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ ජීවාත්ම මත රැඳී ඇති මළකඩ ඉවත් කර, සිහිපත් කිරීමේ වන්දනාවේ සිටීමෙන්, බොහෝ සේ ආදරණීය වන්න. ඔබව පරම පියා විසින් ඇද ගන්නා ආකාරයේ එවන් සෙනෙහසක් තිබිය යුතුයි.
2. මායාගේ කුණාටු වලට බිය නොවන්න. මහාවීරයන් වන්න. ඔබගේ දුර්වලතා අඛණ්ඩව ඉවත් කරගන්න. සෑම විටෙකම ප්‍රබෝදමත්ව සිටින්න, කිසිම විටෙක චංචල නොවන්න.

**වරදානය:** මෙම දැනුමේ අසීමිත සම්පත් වලට අයිතියක් හිමි කරගන්න, එවිට යැපීම අවසන් වෙයි. අභ්‍යන්තරයට යොමු වී, පිවිතුරු සිතිවිලි තොගයක් රැස් කරගන්න. පිවිතුරු සිතිවිලි වල බලය ඔබගේ නිෂ්ඵල සිතිවිලි පහසුවෙන් අවසන් කර, ඔබගේ සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් ප්‍රතිමූර්තියෙන් අන් අයවත් පරිවර්ථනය කිරීමටත් ඔබට හැකි වෙයි. පිවිතුරු සිතිවිලි තොගයක් රැස් කරගැනීම සඳහා මුරලියේ සෑම කරුණකටම සවන් දී, බලයේ ස්වරූපයක් ලෙසින් සෑම මොහොතකම කාර්යයන් වෙනුවෙන් ඒවා භාවිතා කරන්න. ඔබ මෙම පිවිතුරු සිතිවිලි බලයේ තොග කෙතරම් ප්‍රමාණයක් රැස් කරගන්නේද, ඒ අනුව ඔබගේ මනසේ බලයෙන් නොකඩවා සේවය කිරීමේ අත්දැකීම් පහසුවෙන් ලබයි.

**පාඨය:** ඔබගේ මනසේ ඊර්ෂ්‍යාවට සහ ගැටුම් වලට සෑම කලටම සමු දෙන්න, එවිට ඔබ ජය අත්කර ගනියි.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: යෝගා බලයෙන් ඔබගේ මනසින් තමන් මත සහ අන් අය මත පර්යේෂණ සිදු කරන්න.**

ඔබේ ශරීරය, මනස, ධනය සහ කාලය බොහෝ සේ භාවිතා කරමින් ඔබේ මනසෙහි බලයෙන් ඔබ සේවය කිරීම වැඩි වැඩියෙන් කරන තරමට, කෙටි කාලයක් තුළ ඔබට සාර්ථකත්වය අත්කර ගත හැකිය. ඔබේ ස්වභාවය පරිවර්තනය කිරීමේ හෝ සමූහයේ ගමන් කිරීමේ සහ සේවයේ එතරම් සාර්ථකත්වයක් නොපෙනෙන විට අධෛර්යයට පත්වීම නැවැත්වීමට ඔබ දැන් ඔබ මත ගත යුතු උත්සාහය, එම උත්සාහය මුළුමනින්ම අවසන් වනු ඇත.